**ආලෙයිඅඩිවේම්බු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ආලෙයිඅඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වටිනාකම රු.4,950,000 ක් වන වාහන 11 ක අයිතිය සභාවට පවරා දී තිබුණත්, එම වාහනවලට අදාළ වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) වර්ග 45 කට අයත් කාර්යාලයීය ලී බඩු සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කිරීම් මගින් රු.210,775 කට විකුණා තිබූ අතර, වර්ග 21 කට අයත් කාර්යාල ලී බඩු සහ උපකරණ විනාශ කර තිබූ නමුත් මෙම වත්කම්වල පිරිවැය ගණනය කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 අයවිය යුතු මුදල්**
**--------------------**

1991 වර්ෂයේ සිට හිඟහිටව පැවැති මියගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.65,070 ක ණය ශේෂය ඔවුන්ගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

**1.3.3 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**
**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වල අත්සන් කිරීම වැනි කටයුතු නිලධාරීන් තිදෙනෙකුට රාජකාරීමය වශයෙන් පවරා තිබුණද, එම නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 මුදල් රෙගුලාසිය | වර්ෂ දෙකක් ඉක්ම වූ එකතුව රු. 549,198 ක් වටිනා ඉකුත් තැන්පතු 09 ක් අදාල පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලබන එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපතිටද පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට යැවිය යුතු වුවද, 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේද තුළ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලැබූ රු.12,996,980 ක් වටිනා එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එලෙස දැනුම් දී නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.5,079,193 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,709,759 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,630,566 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වන කුලී සහ අනෙකුත් ආදායම් පිළිවෙලින් සියයට 62 කින් සහ සියයට 82 කින් වැඩි වී තිබුණද, සේවා සඳහා ගාස්තු සහ රජයේ ප්‍රදාන පිළිවෙලින් සියයට 32 කින් සහ සියයට 12 කින් අඩු වී දක්නට ලැබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2..3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **මස්කඩ බදු දීම**

---------------

2016 දෙසැම්බර් 31 දිනට පැවැති මස් කඩ බදු දීමෙන් අයවිය යුතු රු.606,313 ක හිඟ ශේෂයෙන් රු.526,313 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟ හිටව පැවතුණි.

(ආ) **ව්‍යාපාර බදු**

-------------

2016 දෙසැම්බර් 31 දිනට පැවැති ව්‍යාපාර බදු හිඟ මුදල් රු.16,680 ක ශේෂය වර්ෂ 09 කට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි.

(ඇ) **පොදු වෙළඳපොල කඩ කාමර කුලී ආදායම්**

**----------------------------------------------**

පොදු වෙළඳපොලේ ඇති කඩ කාමර 16 න් කඩ කාමර 10 ක් ඉදිකරන ලද දිනයේ සිට මේ දක්වා කිසිදු අරමුණක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. තවද, 2009 වර්ෂයේදී රු.1,500 ක් සහ රු.2,500 ක් වන මාසික කුලි මත කඩ කාමර ලබාදුන් අයටම මේ දක්වා එම කඩකාමර අඛණ්ඩව ලබා දී තිබුණි. මෙලෙස කුලියට ලබාගත් අයගෙන් ඇතැමෙක් එම කඩකාමර රු.5,000 ක මාසික කඩ කුලියකට උප බදු දී තිබුණි. එම නිසා, වර්තමානයේ පවතින කුලී වටිනාකම පිළිබඳ සැලකිල්ලට නොගෙන එකී කුලියටම ලබා දී තිබූ බැවින් සභාව වාර්ෂිකව රු.240,000 ක ආදායමක් අහිමි කරමින් පැවතුණි.

(ඈ) **පොදු වෙළඳපොල වාහන නැවතුම් පොළ බදු දීම**

**---------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපොලට ආසන්නව පැවැති වාහන නැවතුම්පොළේ හිඟ කුලී රු.63,000 ක් වර්ෂ 02 ක සිට අයකර ගෙන නොතිබුණි.

### 2.3.2 වරිපනම් හා බදු

**--------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ව්‍යාපාර ස්ථාන 577 කින් සහ නිවාස 7,851 කින් වරිපනම් තක්සේරු කර අයකිරීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව ආසන්න වශයෙන් රු.4,000,000 ක ආදායම් අහිමිව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

**---------------------------**

### 3.1 කළමනාකරණ දුර්වලතා

**--------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම රු.මිලියන 8.81 සිට රු.මිලියන 12.74 ක පරාසයක ප්‍රමාණයකින් අත ඉතිරි මුදල් පැවැති බව නිරීක්ෂණය විය. මෙම මුදල් ස්ථාවර තැන්පතු ගිණුම්වල හෝ ක්ෂණික තැන්පතුවල ආයෝජනය කර පොලී ආදායම් ඉපැයීමට පියවර නොගැනීම හේතුවෙන් සභාවට ආසන්න වශයෙන් රු.500,000 ක පොලී ආදායමක් වාර්ෂිකව අහිමි වී තිබුණි.

(ආ) සභාව විසින් භාවිතා කරනු ලබන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කාර්යාලවලින් ලැබී තිබුණු වාහන 12 ක අයිතිය වර්ෂ දෙකකට අධික කාලයක සිට මාරු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) සභාව සතුව පැවැති අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ කැබ් රථයක්, ගල් රෝලක් සහ ට්‍රේලර් 04 ක් අලුත්වැඩියා කර භාවිතා නොකර වර්ෂ දෙකකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) UNICEF ආයතනයෙන් 2013 වර්ෂයේදී ලබා දී තිබූ මෝටර් වාහන 02 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්කාර්ය තත්ත්වයේ පැවතුණි.

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

**3.2.1** **මාර්ගවලට බොරළු යෙදීම**

2016 වර්ෂය සඳහා වන ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මාර්ග 06 කට බොරළු යෙදීම සම්බන්ධයෙන් 2017 සැප්තැම්බර් 07 දින තාක්ෂණික නිලධාරියා සමඟ සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී ලබාගනු ලැබූ මිනුම් අනුව එම මාර්ගවලට බොරළු කියුබ් 436 ක් සහ ක්‍රෙසර් කුඩු කියුබ් 42 ක් ආදී වශයෙන් යොදා තිබුණි. එසේ වුවත්, බොරළු කියුබ් 561 කට සහ ක්‍රෙසර් කුඩු කියුබ් 117 කට ගෙවීම් සිදුකර තිබුණි. මේ අනුව රු.610,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.3** **ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය**

ප්‍රදේශයේ එකතු වන කුණු කසල කන්නගිපුර ග්‍රාමයේ විවෘත ස්ථානයක ගොඩගැසීම හේතුවෙන් පරිසර හානියක් සිදු වී තිබූ අතර එම ග්‍රාමයේ ජීවත් වන මහජනයා ඇතුළු අනෙකුත් ජීවීන්ද පීඩාවට පත් වී තිබුණි. එම නිසා මෙම ගැටළුවට විසඳුම් ලබාදීමේ අරමුණින් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාවලිය සිදුකර කාබනික පොහොර සෑදීමේ මධ්‍යස්ථානයක් රු.1,253,939 ක වියදමින් ඉදිකර තිබුණත් 2017 සැප්තැම්බර් 07 දින වන විටත් ඝන අපද්‍රව්‍ය වෙන්කර ප්‍රතිචක්‍රීකරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.** **පද්ධති හා පාලන**

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| (ආ) | ආදායම් අයකිරීම කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගැනීම. |